A public meeting will be held on September 6 at the Colombo Town Hall, presided over by Mr. Dudley Senanayake, to inaugurate the Million Rupee Fund for the Buddhist mission to Germany and the establishment of Buddha Sasana.

Among the speakers at this meeting will be the Burmese Envoy, the German Envoy, Dr. C. W. W. Kannangara, Mr. A. Ratnayake, Mr. J. R. Jayewardene, Mr. R. G. Senanayake, Mr. H. W. Amarasuriya, Dr. G. P. Malalasekera and Mr. P. de S. Kularatne.

## All over electricity

The Citizens' Committee for Democratic Action has organized a mass meeting at Matale to protest against the activities of the Matale Urban Council regarding the supply of electricity to Matale.

A signature campaign is also been organized against the Council by the Matale Youth League.

# BUDDHIST MISSION TO GERMANY

A public meeting will be held at the Town Hall at 5.00 p.m. on Monday, September 6, to inaugurate a million-rupee fund for a Buddhist Mission to Germany and to establish the Buddha Sasana there.

The meeting is being convened by the Lanka Dhammaduta Society. The ex-Premier Mr. Dudley Senanayake, will preside.

Among the speakers who will address this meeting are the German envoy, the Burmese Minister, the Minister of Food Mr. J. R. Jayewardene, the Minister of Home Affairs, Mr. A. Ratnayake, the Minister of Local Government, Mr. C. W. W. Kannangara, Baddegama Piyaratana Nayaka Thero Dr. G. P. Malalasekera and others.

[...] net sales [...]

Evening Observer 2 September 1954

# STATE WILL AID BUDDHIST PROPAGANDA IN GERMANY

THE Lanka Dhammaduta Society was promised all support to promote Buddhism in Germany by the Cabinet Sub-Committee on Buddha Jayanthi celebrations.

A deputation from the Society met the Sub-Committee. The deputation consisted of Dr. M. J. Perera, Director General of Broadcasting, the Ven. Gnanaponetha, the Ven. Anurudha, Mr. Frederick Moller, the German Upasake, and Mr. Asoka Weeraratne, Secretary of the Society.

The Society will raise a million-rupee fund next month for the propagation of Buddhism in Germany.

Guardian 30 July 54

## GERMANY

The active Hamburg Buddhists received Mr. A. Weeraratne at a well organized public meeting when, as reported in our last number, he reached that country from Ceylon. The meeting opened with the taking of the Five Precepts, led by Mr. Severloh-Mohr who, in addition, gave a brief talk on Satipatthana. Dr. H. Palmie the leader of the local Buddhist group gave an address on the fundamentals of the Dhamma. A number of question were asked by the audience and the meeting received a good press.

The Lanka Dhammaduta Society which sponsored this project under the inspiration of Mr. Weeraratna has provided funds for the printing of Buddhist pamphlets in German and for the regular free supply of two German Buddhist magazines to the principal public and university libraries of Germany, Austria and Switzerland.

World Buddhism April 1953



මේ දිනවල නිස්සරණ වනය බැලීමට මහජනයාට ඉඩ දී ඇත්තේ එහි තවුසන් නැති නිසාය. අසෝක වීරරත්න මහතාද මහණ වන හෙයින් තව කීප දිනෙකින් නිස්සරණනයේ කුටි බැලීම පිණිස කිසිවකුට අවසර නොලැබෙයි. ''කොහොමද ඔබේ අදහස?'' මගේ මිත්‍රයා පෙරළා එන ගමන් මෙසේ ඇසුවේ මං වෙනස් වීදැයි දන ගැනීමට යි.

ඇත්ත වශයෙන් මම වෙනස් වී සිටියෙමි. වීරරත්න මහතා ගේ නිස්සරණාධ්‍යංශය වටහා ගතිමි. උපතින් ලැබුණු ඉහළම ලෞකික සම්පත්තියත්, කීර්තියත් නිසරු දෑ සේ සලකා, ඒවා ලෝක වාසීන්ගේ හිත සුව පිණිස පූජා කොට සසර පුරුද්දෙන් මෙන් ඇරඹූ මේ සත් කෘත්‍යය පලවත් වී, බුදු සසුනට නව යුගයක් ඇති වන ලකුණු මගේ සිත තුළ ලැගුම් ගත්තේය.

''ඔබ මුලදී කී සියල්ල දැන් විස්වාස කරමි'' යි මම මිත්‍රයාට පිළිතුරු දිනිමි.

''ඔබ නොදන්නා තව කරුණක් කියන්නම්. ඔය පින්වත් මහතා, ඉතා කුඩා කාලයේ සිටම පස් පවින් වැළැකී සිටියා. යටත් පිරිසෙයින් උම්බලකඩ කැල්ලක් වත් ආහාරයට ගෙන නෑ. ඉතා වටිනා රන්, මැණික් අත් ඔර්ලෝසු වෙළහෙළඳාම් නිසා අත පත ගැවත් අද වන තුරු රන් මුද්දක් හෝ ඔර්ලෝසුවක් හෝ පැළඳ නෑ. ආරම්භයේ පටන්ම බෞද්ධ සම්මේලන යේ ප්‍රබල නායකයෙක්.''

''ඒ වුණාට ඒ මහතා අවංක බෞද්ධයෙක්'' යැයි මම කීවෙමි.

8888888888888888888888888888888888888888888888888888

අනෙකෙහි වූයේ  මේ වැකි තුනයි.
1. මෙහි කිසිම සම්මාදම් ඉල්ලීමක් නැත.
2. සිය කැමැත්තෙන් දෙන මුදල්ද බාර ගනු නොලැබේ.
3. වැඩක් ඇතොත් කරවා දීම කළ හැකිය.

මේ නිස්සරණ වනය ද අනෙක් බොහෝ භාවනා මධ්‍යස්ථාන මෙන් මහ බොරුවක් යැයිද, මුදල් උපයන ව්‍යාපාරයක් යැයිද ඇතැමුන් විසින් කියන ලද කතා කිසි පදනමක් නැති හිතින් මවා ගත් මුසා  බව ඉහත දක්වූ වගන්ති වලින් මනාව පැහැදිලි විය.

අද සසුන ද එදා කාශ්‍යප බුදුන් ගේ සසුන මෙන් පිරිහී ඇත. එබැවින් සසුනට නව පණක් දී යළි නගා සිටුවීමට මෙ බඳු පිළිවෙතින් හෙබි තවුස් අරණක ඇති වැදගත් කම ගැන මෙනෙහි  කරමින් සිටි මම ''ආයුබෝවන් මහත්මයා, ඔබ නැවැතත් දක ගැනීමට ලැබීම වාසනාවක්'' යන මහ හඬින් තිගැස්සී බැලීමි. ඒ අර ඔබ මොබ දුව පනිමින් සිටි පුද්ගලයා, මගේ මිතුරා හඳුනාගෙන පිළිගත් සැටියි. ඔහු ගේ දෙනෙතින් , කටින් හා දෙකම්මුලෙන් නිකුත්  කාන්තියෙන් වශී වූ මම දහම් පත පොතෙහි සඳහන් වන ''පස්වණක් ප්‍රීතිය'' මුල් වරට හඳුනා ගතිමි. ඔහු ගේ ඉඳුරන් පමණක් නොව සිරුරේ ලෝම කූපයක් පාසා එම ප්‍රීතියෙන් ඇළලී ගොස් තිබුණ සැටියි මට පෙනුණේ.

''අද යාළුවකුත් එක්ක ඇවිල්ලා තියෙන්නෙ. බොහොම හොඳයි. වෙහෙස ඇති නොවැ? යමු මොකුත් බොන්න.''

සිසිල් බීම වීදුරුව අතට ගෙන වට පිට බැලීමි. ඔහු තව ද කීප දෙනකු කැඳවා ගෙන අප සිටි දෙසට එනු පෙනිණි.

''මේ මේ ඇහුණ ද' කුටි බලන්න ගිහිල්ල එන කොට හුඟක් බඩගිනි වෙනවා. ආපසු ආ විට මෙහි දී කෑම ටිකකුත් කාලා යන්න පුළුවන්. ඔව්, ඔව්, එන්නම ඕනෑ.''

''පුදුම ශ්‍රද්ධාව! බෝධි සත්ත්ව කෙනෙක් !'' යනු මගේ සිත කියනු දැනිණි.

අපි කුටි බැලීමට ගියෙමු. කන්ද මඳක් නැංග තැන මුලට ම හමු වූයේ ගිලන් තපස්වීන් ට ප්‍රතිකාර කෙරෙන ගිලන්හලයි. ඉන් යාර 300 ක් පමණ ගිය විට පළමුවන කුටිය හමු විය. එහි එක කාමරයකි. එයට යාබද වැසිකිළිය ළඟින් ම විහිදී ගිය අඩි 45 ක් දික්වූ ඇතුළු සක්මන යි. කාමරයට පිටින් වතුර ටැංකිය ඉදිරි පස ඒ තරම්ම දික්වූ පිට සක්මනයි. කුරු කුහුඹුවකුටද නැඟිය නොහැකි වන සේ එම සක්මන වටා දැමූ අඟල් 8 ක් පමණ  පළල දිය අගලෙකි. තවුස් තෙමේ එහි හුදකලාව භාවනා කරන්නේය. අනෙක්  කුටි 14 ද එ පරිදිම විය. ඝන වනය මැද පිහිටි මේ කුටි එක කට එකක් නො පෙනෙයි. ඒවා අවට වන සිරිය. කලබලකාරී අසංවර සිතක් වුවද දමනය කර සන්සුන් සුවය ළඟා කර දීමට සමත් වෙයි. කුටි අතර තුර කන්ද කපා සමතලා කළ විශාල බිමෙක සිත් සතන් නිවන  සුදු බුදු මැදුරත්, ධර්ම ශාලාවත් පිහිටුවා ඇත. මේ සියල්ල බැලීමට ගත වන්නේ පැ කීපයකි. සැතපුම් දෙකකට වඩා පයින් යන්නට නැත.



Morning Times December 10, 1955


MORNING TIMES, SATURDAY, DECEMBER 10TH, 1955.

Stopped! for a Superb Job of Repair and Service step in at

MORN

Vol. 2. No. 28.

REGISTERED AS A NEWSPAPER AT THE G.P.O. IN THE UNITED KINGDOM.

COL

ALL HOSPITAL

MR. DUDLEY SENANAYAKE, M.P. and Dr. Georg Ahrens, Minister for Germany in Ceylon laying the foundation-stone for the new Buddhist centre which is sponsored by Lanka Dhammaduta Society.—(Report on this page).

## මීතිරිගල

(1968 ඔක්තෝබර් 28 වෙනිදා ශ්‍රී ලංකාදීප පුවත්පතේ පළ වූ ලිපිය - කතෘ මහානාම මහතා)

"ඔබ ගියාද මීතිරිගල ?"
"නැතැයි කීමට හිස සැලූ මම "ඔබ ගියා ද"යි පිළිවිසීමි.

"ඔව් මං ගියා පහු ගිය මාසේ, අර පත්තරේක කියා තිබුණ හැටියට ඇත්තෙන්ම එය 'අසිරිමත් තපෝ වනයක්'. මෙතෙක් නොදුටු විරූ නොඇසූ විරූ තැනක්. අක්කර පන්සියයක පමණ කැලෑ කඳු බිමක් නිස්සරණ වනයක් බවට පෙරළා ඇති සැටි අරුමයි, පුදුමයි. මේ සඳහා ම පෙරුම් පුරා පැමිණි පින්වතකුට මිස සෙසු කෙනකුට කළ නොහැකි වැඩක්. මං එහි ඇතුළු වූ සැටියේ ම මගේ සිත මෙලෝ බරින් සැහැල්ලු වී අමුතු ලොවකට පැමිණියාක් මෙන් දැනුණු ආකාරය කියන්නට මට පිළිවන් කමක් නෑ. මිනිසුන්ගෙන් තොර ඒ සන්සුන් පරිසරයේ කුටියකට වී අරමුණක් ඇතිව බුදු හාමුදුරුවන් දක් වූ ආකාරයට භාවනාවේ යෙදෙන පින්වතා මාර්ග ඵල වලට පැමිණ අන්තිමේ දී රහත් බව ද ලබනවාට මට නම් කිසිම සැකයක් නෑ."

මම සිනා සෙන්නට වීමි. මගේ මිත්‍රයා, යමක් ඇසූ දුටු පමණින්ම සැදැහැයෙන් ඉස වසා ගන්නෙකි.

"ඔබට හිනා කතරගම දෙවියන්, උපුල්වන් දෙවියන් ආදීන් සමඟ ද විහිළු තහළු කරන ඔබට මේ වාගේ දේ ගැන විස්වාසයක් කොයින්ද? මා කී කතාවේ ඇත්ත නැත්ත ඔබට ම තේරී යාවි එහි ගියොත්."

"හොඳයි, ඔබත් එනවාද මා සමඟ එහි යන්න?"

"ඔව් එනවා."

අපි පසුදා (පෝය) මීතිරිගල නිස්සරණ වනය බලා පිටත් වීමු. කොළඹ සිට මහ නුවර පාරේ 16 වැනි කණුව අසල බැලුම්මහර හන්දියෙන් දකුණට හැරී සැතැපුම් 3 ක් මඟ ගෙවා වැලිවේරියෙන් වමට හැරී සැතැපුම් 8 ක් ගොස් කිරිඳිවැලට පැමිණ, නව සැතැපුම් දෙකක් ගෙවා පල්ලේගම හන්දියෙන් වමට හැරී සැතැපුම් 3 ක් ගිය පසු මීතිරිගල කැලෑ කඳු බිම පෙනෙන තෙක්මානයට පත් වීමු.

මඟ දිගට නවතා තිබුණු සිය ගණන් වාහනත් ගමන් රියත් එ දින පැමිණ සිටි සැදැහැවතුන් ගේ සංඛ්‍යාව සුළු පටු නොවන බවට දෙස් දිනි. අලුතින් තැනුණු අතරක් නැති සල් පිල් හා කඩ සාප්පු නිසා මුළු පෙදෙස නව නගරයක සිරි ඉසිලීය. අප ඉදිරියේ වැල නොකැඩී ගමන් ගත් බාල තරුණ, මහලු මහාජනකාය, යාර 250 ක් පමණ පිය මං කොට පටු පාලමෙන් එගොඩ වී මනහර වෙල් යායක් හරහා ගොස් වමට හැරී කඳු ගැටය මඳක් නැංග තැන අපට දිස් වූයේ එකම හිස් ගොඩකි. කාර්යාලය පිහිටි විශාල මඩුවේ ඔවුන් පෙළ ගැසී සිටියේ නිස්සරණ වනයේ තැන තැන පිහිටි තවුස් කුටි බැලීමේ වාරය එන තෙක්ය.

සුදු රෙද්දෙන් හා බැනියමෙන් හා සරසා ගත්, කඩවසම් සිරුරින් හෙබි මැදිවියේ පුද්ගලයකු කඩියකු මෙන් කඩිසර ගමනින් ඔවුන් සිසාරා ඔබ මොබ යමින් සිය කටවත් දතටත් කිසිදු අස්වැසිල්ලක් නොදෙන සැටි දක ඒ කවරෙක් දැයි විමසිලිමත් වීමි.






In November 1955 the Government granted to the Society an acre of vacant crown land in Bullers Road, Colombo on a 99-year-old lease. The foundation stone was laid on December 9, 1955 and number of prominent personalities including Hon. Dudley Senanayake, Hon. H.H. Basnayake, Dr. Georg Ahrens, Hon. Arnold Ratnayake (Minister for Home Affairs), Mr. J.L.E. Fernando, Mr. H. Nelson H. Soysa and Mr. Asoka Weeraratna participated in the function.

Two buildings were constructed on this block of land. One building was to be used as the Main Office, while the other building was to be used as the Monk's Quarters and Training Centre for Dhammaduta monks. In August 1956, Hon. S.W.R.D. Bandaranaike, Prime Minister, declared open at a ceremonial public meeting, amidst a large gathering, the newly built Headquarters and Training Centre of the Society at 417, Bullers Road (Bauddhaloka Mawatha), Colombo 7 consisting of a two-storied dormitory of 14 rooms, an Assembly Hall, Office and Library, built at a cost of Rs. 125.000.


Eight prominent Buddhist monks led by the German monk Ven. Ñânatiloka Mahâthera and including Ven. Balangoda Ânanda Maitreyya, Ven. Galle Anuruddha, Ven. Akuretiye Amaravansa, Ven. Ñânaponika (German), Ven. Kudawella Vangîsa and Ven. Vappo (German) were attached to the Centre. These monks offered their services to train German Buddhists and others in the study of Buddhist Philosophy.



Foundation Stone laying ceremony on December 9, 1955

Photo: Recitation of Pansil
On the left hand side of the picture are seated Venerable monks including Ven. Narada, Ven. Baddegama Wimalawansa and Ven. Madihe Pannasiha

At the Table - Left to Right:
Mr. Dharmasena Weeraratna, Mr. J.L.E. Fernando, C.C.S. ( President, LDS), Hon. Dudley Senanayake ( former Prime Minister and Trustee, LDS), Asoka Weeraratna ( Founder and Hony Secretary, LDS) and Mr. Nelson Soysa (Trustee, LDS)




Left to Right: Hon. Dudley Senanayake ( former Prime Minister and Trustee, LDS) Dr. Georg Ahrens ( Ambassador of West Germany) in dark suit laying the foundation stone, Mr. J.L.E. Fernando, C.C.S. ( President, LDS) and Mr. Arnold Ratnayake, Cabinet Minister.



Left to Right: Mr. Hema Basnayake (Attorney – General and Trustee, LDS), Mr. Asoka Weeraratna (Hony. Secretary, and Trustee, LDS) and Hon. Dudley Senanayake (former Prime Minister and Trustee, LDS), Dr. Georg Ahrens ( Ambassador of West Germany) in dark suit laying the foundation stone, Mr. J.L.E. Fernando, C.C.S. ( President, LDS) and Mr. Arnold Ratnayake, Cabinet Minister.



1968 ඔක්තෝබර් මස 28 වෙනිදා "ශ්‍රී ලංකාදීප" පුවත්පතේ පළ වූ ලිපිය මෙහි දැක්වේ.



SRI LANKADIPA, October 28, 1968.

සතර මහ පල ලබනු සඳහා ඇතුළුවන මහා දොරක් වැනි මහියංගල නිස්සරණ අරණ පහළවී ඇත්තේ පිරිහී යන බුදු සසුන යළි නගා සිටුවීමට කාලයා විසින් ඇති කරන ලද වුවමනාව නිසාදැයි හැඟේ.

මහනාම විසිනි

අක්කර 500 ක් පමණ විශාල මහ වනයේ තැනින් තැන එකට එකක් පරදවන අන්දමේ දකුම්කලු කුටි තනා තිබුණි. මේ සෑම කුටියක් ම සක්මන් මලුවකින් වැසිකිලියකින් හා ජලනල සහිත වතුර ටැන්කියකින් ද සමන්විත ය.

කුටියේ කාමරයක් අඩි 10 ක් දිග බවත්, අඩි 7 ක් පළල බවත් මඟ පෙන්වීමට ගිය රොම්යෙල් අපට විස්තර කර දුන්නේ ය. ඇතුළු සක්මන් මලුව අඩි 45 ක් දිග අඩි 4 ක් පළල වූ මුත් එළිමහන් සක්මන් මලුව අඩි 90, 60, 45 යන ප්‍රමාණවලට ඇති බවත් කීය. පිට සක්මන් මලු කාණ්ඩ දෙකකට බෙදා වෙන්කර තිබුණේ දිය අගලක් මගිනි. මේ කුඩා දිය අගලේ තේරුම කුමක් දැයි විමසූවිට හේ කීවේ කුඩා කෘමි සතුන් ගෙන් වන හානි වැලැක්වීමට එය තනා ඇති බවයි.

සක්මන් මලුවේ වැලිතලාමත සක්මන් කර වෙහෙස වූ විට විඩා සංසිඳුවා ගැනීමට සිමෙන්ති පුටුවක් ද ඊට ආවරණයක් ද සවිකර ඇත.

නිස්සරණ වනයේ තනා ඇති ඉතාම ප්‍රියංකර කුටිය වශයෙන් නොම්මර 12 නම් කිරීමට පුළුවන. එය විශාල ගල්පර්වතයක් මුදුනේ තනා ඇත. එය බැලීමට යාම සඳහා ලෑලි තරප්පු සවිකර තිබුණි. ඒ අසලම විශාල ධර්ම ශාලාවක් ද විහාර මන්දිරයක් ද තනා ඇත.

දැනට යෝගී හිමිවරුන් වැඩ සිටින කුටි හැර අනෙක් සෑම කුටියක් ම අපි නැරඹුවෙමු. මේ ගමනේ දී ශ්‍රී පාද වන්දනා ගමනද මතකයට නැඟෙන්නේ දෑවැන්ත වෘක්ෂලතා, ගල්තලා අතරින් බැස යන සිසිල් ජලධාරා සහිත ඇළ දොළ නිසා ය.

15 වන කුටියට ආසන්න ව දානශාලාවකි. අප ඊට ළඟා වූ සුලු මොහොතින් එහි ඇති යකඩයක් නාද කිරීමෙන් පසු නායක හිමියෝ පැමිණ බුද්ධ පූජාව පැවැත් වූහ. ඊට අනතුරු ව මදය අස් කල ලී කොටයකට මිටියකින් ගසන හඬ අසා, කුටිවල සිටින සියලුම යෝගීන් වහන්සේ එතැනට පිණ්ඩපාත වැඩියහ.

එම ආහාරය ගහක් මුලදී හෝ ඇළක් අසලදී වැළඳීම කරන බව අප සමඟ ගිය ළමයා කී ය.


පුරාණයේ යෝගීන් වහන්සේ සේනාසන ආරණ්‍යවල ගතකළ ජීවිතවලට අනුකූල ව සියලු ම කටයුතු චාම් අන්දමින් හා නීත්‍යානුකූල ව සකස් කර තිබීම නිසා මෙම ක්‍රමය වඩාත් සාර්ථක විය හැකි බව කාගේත් පිළි ගැනීම ය.

ලංකාවේ නොයෙක් පළාත් වලින් දිනපතා මෙම භූමිය නැරඹීම සඳහා පැමිණෙන මහජනයා නිසා දැන් එය නැරඹීම තරමක් අසීරු තත්ත්වයකට පත් ව ඇත.






Left to Right: Mr. Hema Basnayake (Attorney – General and Trustee, LDS), Mr. Asoka Weeraratna (Hony. Secretary, and Trustee, LDS) and Hon. Dudley Senanayake (former Prime Minister and Trustee, LDS)




Dr. Georg Ahrens (Ambassador of West Germany) is seen delivering his address.



Left to Right: Mr. U Ba Lwin, Burmese Ambassador, unknown, unknown, Mr. Dudley Senanayake, Master Senaka Weeraratna (child ) partly covered, Mr. Asoka Weeraratna, Master Tissa Weeraratna (child) partly covered, German National ( Mr. Walther Schmits ?)

The Two buildings that were constructed on this block of land. The building in front was to be used as the Main Office, while the building at the back was to be used as the Monk's Quarters (Sanghavasa ) and Training Centre for Dhammaduta monks





**සිත්තමක්**

මෙහි ගල් පර්වතයක, භාවනානුයෝගීන්වහන්සේ පස්නමක් සිත්තම් කර තිබෙන දුටු අප මේ චිත්‍රය ගැන විස්තර දැන ගැනීම සඳහා එහි භාරකාර මහත්මයකුගෙන් විමසුවෙමු.

''මේ චිත්‍රගත කරල තිබෙන්නේ කසුප් බුදුන් කල කථා පුවතක්. දැන් අපේ රටේ මේ බුද්ධ ශාසනය වාගේ කාශ්‍යප බුද්ධ ශාසනයද ද, පිරිහීයන්නට පටන් ගත් විට භික්ෂූන් වහන්සේ හත්නමක් මහා උස පර්වතයකට නැගලා ජීවිත කාලය තුළදී ම නිවන් දැකීමේ අධිෂ්ඨානය ඇති කරගෙන දැන් මේ වනයේ කෙරෙන්නා වාගේ භාවනා කළා. උන් වහන්සේගෙන් එක් නමක් රහත් වූ අතර තවත් නමක් අනාගාමී විය. ඉතිරි පස්නම අවසානයෙහි දෙව්ලොව ඉපිද ඒ බුද්ධාන්තරය දෙව්ලොව ගත කොට, එදා දැරූ ප්‍රයත්නයේ ප්‍රතිඵලයක් වශයෙන් මිනිස් ලොව ඉපිද අප ගෞතම බුදුන් වහන්සේ හමුව නිවන් පසක් කළහ.

''කවුද ඒ නිවන් දැක්ක පස් නම?'' මම ප්‍රශ්න කෙළෙමි.

''දාරුචීරිව, පුක්කුසාති, කුමාර කස්සප, දබ්බමල්ලපුත්ත, සභිය'' ඔහු කීහ.

**පිළිවෙත්**

නිස්සරණ වනයේ යෝගීන් වහන්සේ පිළිපැදිය යුතු ප්‍රතිපත්ති මාලාව එහිම තවත් පසෙක සටහන් කර ඇත.

1. මෙහි ඇතුළත් යෝගීන් වහන්සේලා මාර්ග ඵලයක් ලැබෙන තුරු ආරණ්‍යයෙන් පිටනොවෙත්.
2. කිසිම ගිහියෙක් සමඟවත්, පිට කිසිම භික්ෂුවක් සමගවත් කථා නොකරත්.
3. මොනම කරුණක් නිසාවත් ධර්මය ගැනවත් ලිපි නොලියත්,
4. මාර්ගඵලයක් නො ලැබුණේ නම් පටන් ගත් වීර්යයෙන් යුතුව ජීවිතාන්තය දක්වා ම විදර්ශනා භාවනා වඩත්.
5. මාර්ගඵල ලැබුණාට පසු උන්වහන්සේ ලා අනුකම්පාවෙන් බොහෝ දෙනා ගේ හිත සුව පිණිස අවබෝධ ඥානයෙන් මහජනයා අතරට වඩිනවා ඇත.

ආරණ්‍යය නැරඹීමට යාමට සිටින පිරිසට මෙහි දි හැසිරීම පිළිබඳ උපදෙස් දී මාර්ග පෙන්වීම පිණිස ළමයකු එවනු ලැබේ.

උපදෙස් කෙසේ වෙතත් තැනින් තැන 'නිශ්ශබ්ද වෙනු' යන දැන්වීම් සවිකර තිබුණත් අපට එක් වූ පිරිසක් වනයේ තිබූ නිහැඬියාව බිඳිමින් ගමන් කළහ. අපට පළමුවෙන් ම මුණ ගැසුණේ ගිලන් හලයි. එහි වැදුණු පිරිස පොරකකා කාමරය තුළට දණ නමස්කාර කරනු දුටු මම ද ඒ කුමක් දැයි දැක බලා ගැනීමට එතුළට වැදුණෙමි. සරමක් හා බැනියමක් හැඳ සිටි කෙනෙක් එහි වූහ. ඔහු දසසිල් රකින්නකු බව දැන ගත්තේ මග පෙන්වන්නා ගෙනි.

පසුගිය පෝ දිනයක පන්නිපිටියෙන් මීතිරිගල බලා බස් රථයකින් එම වන්දනා ගමන සංවිධානය කලේ මගේ මිත්‍රයකු නිසා ඒ සමගම ගොස් මගේ අදහස ද ඉටුකර ගැනීමට අදහස් කෙළෙමි.

උදේ 6 ට පමණ පන්නිපිටිය මංසන්ධියෙන් බසය පිටත් විය. ටික දුරක් යනවිට බසය තුළවූ නිහැඬියාව බිඳිමින් එක් උපාසක අම්මා කෙනෙක් ප්‍රශ්නයක් නැගූහ.

"ඇයි දරුව ඔය යන තැනට නිස්සරණ වනය කියන්නෙ"

"නිස්සරණ කියන වචනය පාලි වචනයක්. ඒකෙ තේරුම 'නිවන'. ඒ මහණ වෙලා ඉන්න ඇත්තන් මේ ජීවිතයේදීම නිවන් දකින්නයි බලාපොරොත්තුව. ඒ නිසා තමයි ඒ කැලෑවට 'නිස්සරණ වනය' කියන්නෙ" මගෙ මිත්‍රයා පිළිතුරු දුන්නේ ය.

"කවුද ඔය ආරණ්‍යය පටන් අරන් තියෙන්නෙ?"

"කොළඹ මරදානේ ස්වර්ණාභරණ ඔර්ලෝසු වෙළෙඳ ව්‍යාපාරයක් අයිතිව හිටපු අසෝක වීරරත්න මහත්මය යි. ඒ මහයත්මයාගේ තිබුණ ලක්ෂ ගණනක දේපල පරිහරණයෙන් ඈත් වෙලා තමයි ආරණ්‍යයේ වැඩ කටයුතු වලට බැහැල තියෙන්නේ. අක්කර 500 ක් විතර මීතිරිගල කැලෑවෙන් අරන් තිබෙන ව ඔය ආරණ්‍ය තැනීමට."

කථාවෙන් කථාවෙන් අපේ බස්රථය දොම්පෙ ආසනයේ කිරිඳිවැල බස් රථ මාර්ගයට ළඟා විය. දැන් වේලාව උදේ 8.00 ට පමණ ඇත.

නිස්සරණ වනයට වැටී ඇති කුඩා මාවතේ අපේ බස් රථය සෙමෙන් ඉදිරියට ඇදුණි.

"මෙතැනින් තමයි මීතිරිගලට යන්නෙ."

අපි බසයෙන් බැස එහි වූ කුඩා පාලමින් ගොඩවී වෙල්යායක් මැදින් වූ මහ නියර දිගේ ඈත පෙනෙන මීතිරිගල වනයට පිය නැගුවෙමු.

පාවහන් බසයේම දමා ආවා නම් හොඳයයි අපට සිතුණේ වනයට ඇතුළුවන විටම පෙනෙන දිය සෙවෙල් බැඳි කන්ද නැගීමට ඇති ගල්පඩිපෙල දුට විටය.


අඩි 25 පමණ කන්දක් කපා නිස්සරණ වනයට යන තැන අලංකාර විශ්‍රාම ශාලාවක් මහජනයාගේ ප්‍රයෝජනය සඳහා ඉදිකර තිබුණි. එහිවූ එක් දැන්වීම් පුවරුවක මෙසේ සඳහන් විණි:

මෙහි කිසිම සම්මාදම් ඉල්ලීමක් නැත.

- සිය කැමැත්තෙන් දෙන මුදල්ද භාරගනු නොලැබේ.

- කාර්යාලයෙන් විමසා වැඩක් ඇතොත් කරවා දීම කළ හැක.





කොළඹ 07, බෞද්ධාලෝක මාවතේ අංක 417 දරණ ජර්මන් ධර්මදූත සංගමයේ මූලස්ථානය



The headquarters and training centre of the German Dhammaduta Society declared open in 1956 by the late Prime Minister, Mr. Bandaranaike

# The Buddhist Mission to Germany

SAMARASIRI DE SILVA

A Buddhist Mission, sponsored by the German Dhammaduta Society, left Ceylon for Germany on Saturday, June 15, 1957. The purpose of the Mission is to preach the message of the Buddha to the German people.

Mr. S. W. R. D. Bandaranaike, the present Prime Minister of Ceylon, in a message to the Lanka Dhammaduta Society in 1953, stated that " this is a period in world's history when the spiritual values, which are of such inestimable benefit to mankind, are vigorously assailed by those who believe in purely materialistic doctrines. The Buddha Dhamma has an appeal particularly to those who are perplexed by the confused and complicated changes that are taking place ".

The idea of Buddhist Missions is not new. Even during the time of the Buddha many a disciple carried the Message of his Teacher to many lands near and far. Later on, the Emperor Dharmasoka sent his own son and daughter, Mahinda and Sangamitta, to Ceylon, where Buddhism is still preserved in its pristine form. Subsequently, Buddhist Missionaries went as far as China and Japan in the Far East, Java in South-East Asia, and to the Empire of Alexander the Great in the West.

It is befitting that the organizers of the Lanka Dhammaduta Society should have thought of Germany—a country that has produced such great philosophers as Schopenhauer, Kant, Fichte, Schelling and Hegel—for their first mission to the West in modern times.

The idea of a Buddhist Mission to Germany occurred to a young Ceylonese businessman dealing in valuable treasures, while he was in Germany in 1951. On his return to the Island, Mr. Asoka Weeraratne, organized the Lanka Dhammaduta Society. In 1953, Mr. Weeraratne, who was by this time the Honorary Secretary of the Society, in his second



## මේ ආත්මයේදී ම නිවන් සොයන්නෝ

(1968 ඔක්තෝබර් 20 දා පෝදා 'ඇත්ත' පුවත්පතෙහි පළ වූ ලිපිය - කතා : හෙන්රි පමුණුව මහතා)

"නොදකින නිවනක් ගැන මොනවට මහන්සි වෙනවද? ඊට වැඩිය හොඳයි තමුන්ගෙ වැඩක් බලාගෙන ඉන්න එක" මේ එක් මහාචාර්ය වරයකුගේ කථාවක්.

"නිවන් දකින්න අප කිසිවකු කැමති නෑ. අප ඔක්කොම කරන්නෙ බොරු." ඒ අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ උසස් නිළධාරියකුගේ ප්‍රසිද්ධ කථාවක කොටසක්.

"අප කාගේත් බලාපොරොත්තුව නිවන් දැකීමය. එම නිසා මේ සියලුම පින්වතුන්හට රැස් කරගන්නාවූ සියලු කුසල් බෙලෙන් අමා මහා නිවන් සුව අත්වේවා" මේ නායක ස්වාමීන් වහන්සේ නමකගේ ධර්ම දේශනයෙන් කොටසකි.


නිවන පිළිබඳ බොහෝ දෙනා අතර විවිධ මත ඇති බව මෙයින් වටහා ගත හැකිය.


රබර් වතු පොල්වතු හෝ වෙනත් වෙළෙඳ ව්‍යාපාර පවත්වා ගෙන යමින් බෙන්ස් කාර්වලින් යමින් සිග්නල් නැතිව කාර්වලින් ගිය හැටි ගැන පුරසාරම් ගසමින් මහාරාජාවරුන් මෙන් ජීවත් වන හාමුදුරුවරුනට නම් මේ ආත්මයේ තියා මෛත්‍රී බුදුන්ගේ කාලයේදීවත් නිවන පිළිබඳ සිතීමට වත් ලැබේදැයි සැක සහිතය. එහෙත් මේ ආත්මයේදී ම නිවන් දැකීමට වැර වඩන හිමිවරුන් ද සොයා ගන්නට සිටීම බෞද්ධයන්ගේ වාසනාවකි.


"හික්ඛු සම්මා විහරෙයි සුං අසුඤ්ඤො ලෝකෝඅරහංතෙයි අස්සාති" යනුවෙන් බුදුරජාණන් වහන්සේ මහා පරිනිර්වාණ සූත්‍රයෙහි දේශනා කර ඇත.

මෙකල යම්කිසි අයකුට මාර්ගඵල ලැබිය නො හැකිනම් එසේ වන්නේ ඔහු හට ඒ සඳහාම දිවිකැප කොට අත්නොහැර නොකඩවා හාවනා නොකිරීම නිසාය. යනු එහි අදහසය.

මේ උතුම් ධර්ම පාඨය අනුව යමින් මේ ආත්මයේදීම සතර මාර්ග ඵල ලැබිය හැකි බැව් පවසමින් එක්තරා අයකු විසින් සාදන ලද ආරණ්‍යයක් පිළිබඳව දැන ගන්නට ලැබීමෙන් පසු මෙම ආරණ්‍ය දැක බලා ගැනීමේ සිතක් මට ද පහළ විය.











visit to Germany made a survey of the Buddhist activities in that country. He found that there was a great desire among the German people to obtain a proper understanding of the Doctrine enunciated by the Buddha. They in their small way, in pursuance of their enthusiasm to gather knowledge, had formed themselves into groups devoted to the study of the Philosophy of Buddhism. This intelligent approach to Buddhism was further speeded up by organized study classes and regular lectures in a number of important cities. Several of these Buddhist Societies have their own libraries and some of them publish periodicals on Buddhism. It is now left to the Mission to muster these forces together.

The Society in 1954 launched a Million-Rupee Fund under the patronage of Mr. Dudley Senanayake, former Prime Minister, to help spread the Message of the Enlightened One to the people in Germany who were eagerly looking towards the East for spiritual wisdom and guidance, particularly the wisdom of the Buddha.

Amidst other objectives the Lanka Dhammaduta Society was formed for the following purposes :—

"(a) To establish and maintain a Bhikku Sangha in Germany and other countries in the West and to provide means and conditions necessary for such Bhikku Sangha to live the religious life in accordance with Vinaya Rules and to engage in Dhammaduta work.

(b) To found and maintain institutions in Germany and other countries in the West for the propagation of Buddhism and Buddhist culture and to assist existing institutions engaged in such work."

The good work done by the Society soon won the recognition and encouragement of the State and its Million-Rupee Fund was declared an Approved Charity by the Government.

August last year saw the ceremonial opening by the Prime Minister of the Headquarters and Training Centre of the Society consisting of a two-storeyed dormitory of 14 rooms, an Assembly Hall, Office and Library, built at a cost of Rs. 125,000 on an acre of crown land in Bullers Road, Colombo.

Eight Buddhist monks, led by the well-known German monk and translator of the Tripitaka, Venerable Nyanatilaka Maha Thera, were attached to the Centre. These monks have offered their services to train German Buddhists and others in the study of Buddhist Philosophy. Mr. Friedrich Moller, a teacher of Rackow College, Hamburg, who first came to Ceylon as a trainee in 1953 completed his period of training and received ordination under the name of Bhikkhu Nyanawimala. Many more are expected shortly for training from Germany. The resident monks are also catering to the needs of tourist and transit passengers interested in Buddhism passing via Colombo. Those interested are supplied with literature, and short study courses in the Dhamma are conducted for their benefit.

The Society has undertaken the task of printing and publishing books on Buddhism for distribution in Germany and of helping existing Societies in Germany to expand their present activities. Among the plans envisaged by the Society is the construction of a Vihara, Preaching Hall, Library and Hostel for missionaries and trainees.

The Mission will strive to minister to the spiritual needs of about 3,500 Buddhists in Germany. In addition to this function, it will afford opportunities to non-Buddhists to study Buddhism.

The Mission left with the best wishes of the Buddhist public for its success. But its success or failure can only be measured in terms of how far the Mission is able to re-mould and re-orient the thinking of the German people and thus help build a world of peace and tranquility in this era of uneasy peace.


Reproduced from CEYLON TODAY, a government publication

August 1957



Photo Left to Right:

Mr. Henry Amarasuriya, Hon. S.W.R.D. Bandaranaike, Prime Minister, Mr. Asoka Weeraratna, Hon. R.G. Senanayake, Cabinet Minister and Mr. Dharmasena Weeraratna.





පිළිවෙත්

යෝගීන් වහන්සේලා සඳහා ඉහත දැක්වූ ප්‍රතිපත්ති මාලාව සකස් කර ගෙන ඇත්තේ කසුප් බුදුන් කල සිදුවූ කතා පුවතෙක් ඇසුරෙනි. ඒ කාශ්‍යප බුද්ධ ශාසනය ද පිරිහීගෙන යන විට භික්ෂූන් වහන්සේ සත් නමක් මහා උස පර්වතයකට නැගී ඒ ජීවිත කාලය තුළදී නිවන් දැකීමේ අධිෂ්ඨානය ඇතිව එබඳු ප්‍රතිපත්ති මාලාවක් යටතේ මහා ප්‍රදන් වීර්යයක යෙදුන සේක. ඒ පිළිවෙත් අනුව අප්‍රමාදීව භාවනාවේ යෙදුනු උන්වහන්සේ අතරින් දෙනමක් අභිඥා සහිත රහත් හා අනාගාමී ඵලවලට පැමිණි සේක්ය. ඉතිරි පස් නම අවසානයෙහි දෙව්ලොව ඉපිද ඒ බුද්ධාන්තරය දෙව්ලොව ගතකොට එදා දැරූ ප්‍රයත්නයේ ප්‍රතිඵල වශයෙන් මිනිස් ලොව ඉපිද අප සිදුහත්

ගෞතම බුදුන් වහන්සේ හමුව නිවන් දුටුවාහ. දාරු චීරිය, පුක්කුසාති, කුමාර කස්සප, දබ්බමල්ලපුත්ත සහ සභිය යනු ඒ පස් නමයි.

අක්කර 500 ක භූමි භාගය තුළ එකිනෙකට නොපෙනෙන දුරින් තැනින් තැන දැනටම කුටි 15 ක් තනා අවසන් කර ඇත. පරිසරය නිශ්චලය. සාමකාමීය. භාවනාවට තුඩු දෙන සුළුය. ශාන්තය. සුන්දරය, පළිබෝධයන් තොරය. සම්බාධක රහිතය.

කුටි කාමරයක් අඩි 10 ක් දිගය. අඩි 7 ක් පළලය. අඩි 45 ක් දිග අඩි 4 ක් පළල ඇතුල් සක්මන් මළුවක් එක් එක් කුටියකට යාකර සාදා ඇත. එක් එක් කුටියක් වැසිකිළියකින් ද ජල නල සහිත වතුර ටැංකියකින්ද සමන්විතය. අඩි 90, 60 සහ 45 බැගින් දිග පිට සක්මන් මළු සෑම කුටියක් අසලින්ම තනා ඇත. එක් එක් පිට සක්මනකට උපචාරයක් බැගින්ද කුඩා කෘමි සතුන් ගෙන් වන බාධක මැඩලීම සඳහා දිය අගලකින් ද සමන්විත කොට ඇත. සමතලා කොට වැලි අතුරා තනා ඇති මිදුල ශාන්ත ශ්‍රීයක් උසුලයි. ඇතැම් කුටි පසෙකින් නිබඳ ගලා බස්නා සිසිල් ජලධාරා ඇති දොළය. කුටිවලට සිහිල් සෙවන ගෙන දෙන අමා සිසිලස දනවන දැවැන්ත වෘක්ෂ ලතාවෝය. අහිංසක වන පක්ෂීන් ගේ නිබඳ පවත්නා කර්ණරසායන ගීත රාවයන් ගෙන් බණ භාවනාවට වන බාධාවෙක් නැත.

මීතිරිගල නිස්සරණ වනයට ඇතුල් වී කුටියක් කුටියක් පාසා යමින් ආරණ්‍ය පුරා සැරිසරණ ඕනෑම කෙනෙකුගේ හිතේ පැසවෙමින් පැවති තන්හා ඊර්ෂ්‍යා ක්‍රෝධ මද මනාදී කෙළෙස් මල තාවකාලික වශයෙන් හෝ වේවා සිඳී බිඳී ගොස් සිත පහන් වෙයි. පෙර නොතිබුණු විදියේ සන්සුන් බවකට පත්වෙයි. ගෙදර දොරේ නිතර පහේ පවතින කරදර කම්කටොලු දිනකට හෝ අමතක වී මහත් සැනසුම් සුවයක් විඳියි. මෙහි කුටි සැලැසුම් කොට ඉදිකර ඇති ආකාරය මනහරය. එක් එක් කුටියක් වටා ඇති පරිසරය ඒ ඒ කුටියටම ගැලපෙන අයුරෙන් මැනවින් සැලසුම් කර සකසා ඇත. බොහෝ කුටි සම තැනිතලා මත පිහිටියේය. ඇතැම් කුටි පිහිටියේ නිබඳ ගලා බස්නා සිසිල් ජල ධාරා ඇති දොල අසලය. ඇතැම් කුටි පිහිටියේ උස් සම බිමක් මතය. ඇතැම් කුටි පිහිටි තවත් ඇතැම් කුටියක් උස කළුගල් පව්වක් මත දර්ශනීය භූමි භාගයක් මැද පිහිටියේය. තවත් ඇතැම් කුටි පිහිටා ඇත්තේ ප්‍රපාතාකාර කඳු බෑවුමක නිම්නවලය. මේ ලෙස එක් එක් කුටිය තනා ඇත්තේ එකිනෙකට වෙනස් වූ රමණීය තැන්වලය.

888888888888888888888888888888888888888888888888

මීතිරිගල නිස්සරණ වනය බිහිවීමට හේතු වූයේ මේ රසවත් පුවතයි. මිනිස් ඉතිහාසයේ අතිශය ශ්‍රේෂ්ඨතම සිද්ධියක් වූ දිනයකි. රුසියන් ජාතික ගගාරින් අභ්‍යාවකාශය වටා කරනම් ගැසූ දින යයි. ඒ ප්‍රථම වරට සිරිලකින් ජර්මනියට ස්ථිර ධර්මදූත සේවයක් ගෙන ගිය ජර්මන් ධර්මදූත සංගමයේ ආරම්භක හා ප්‍රධාන ලේකම් අසෝක වීරරත්න මහතා එවකට සිටියේ ජර්මනියේ බර්ලින් නගරයේය. අභ්‍යාවකාශයේ මිනිසකු සැරිසරන බව ඇසූ විගසම ඒ මහතා තුළ මේ අදහස පහළ විය. "විද්‍යාධරයෝ දන් අජටාකාශයෙහි සැරිසරන්නේ දිගු කලක් තිස්සේ අඛණ්ඩව දියුණු පුවුනු කරන ලද ලෞකික විද්‍යා ශාස්ත්‍රඥයන්ගේ ප්‍රතිඵල වශයෙනි. එසේ ම අපිදූ මනා ශීලයෙහි පිහිටා දීර්ඝ කාලයක් අත් නොහැර ම විදසුන් බවුන් වැඩුව හොත් මේ ආත්ම භාවයේදීම ධ්‍යාන මාර්ගඵල ලැබීම නිසැකයි. එහෙයින් මේ ජීවිතයේම මාර්ගඵල ලැබීම සඳහා ධ්‍යාන භාවනා වඩන්නට පටන් ගැනීමට මේ කාලයයි. මෙකල මාර්ගඵල ලැබිය නොහැකියයි ඇතැමුන් අතර පවත්නා මතය මිථ්‍යාවක් විනා ඇත්තක් නොවේ. බුදුන් වහන්සේ දේශනා කොට ඇති පරිදි ශ්‍රාවක පිරිස අප්‍රමාදව

ධ්‍යාන භාවනා වඩතොත් ලෝකය රහතුන් ගෙන් හිස් නොවේ. "භික්කු සම්මා විහරෙයියුං අසුඤ්ඤො ලොකො අරහන්තෙහි අස්සාති" යනු විසින් මහා පරිනිර්වාණ සූත්‍රයේ වදාරා ඇත්තේ ඒ බවයි. මෙකල කෙනෙකුට මගඵල නොලැබිය හැකි නම් නොහැකිව පවත්නේ ඒ සඳහාම දිවි කැප කොට අප්‍රමාදව අත් නොහැරම නොකඩවා භාවනා නොකිරීම නිසා මිස අන් කිසිත් කරුණක් නිසා නොවේමැයි."

ජර්මනියෙන් ආපසු තම රටට පැමිණි හැටියේම තම සොහොයුරා හමුවූ වීරරත්න මහතා, මින්පසු අන්කිසිම ලෞකික වැඩක නොයෙදෙන බවත්, මුළු මහත් ජීවිත කාලයම මාර්ගඵල ඉපදවීම සඳහා කටයුතු කරනු විනා පින් අතේ වැඩ වුවත් භාවනාවට අනුරූපවන වැඩවල විනා අන් කිසිම වැඩක නිරත නොවන බවත්, තරයේ කියා සිටියේය. ඒ අවල දඩි අදිටනෙහි ස්ථිර සාරවම පිහිටා සිටි වීරරත්නයෝ අගනුවර මරදානේ තමන් සතුව තිබූ ලක්ෂ ගණන් අගනා ස්වර්ණාභරණ හා ඔරලෝසු වෙළඳ ව්‍යාපාරය පා දූවිල්ලක් සේ හැර දමූහ.

ඉන් පසු දිවා රෑ අව්වැසි වෙහෙස මහන්සි නොබලා තම මුළු කාලය යොදවමින් අවුරුද්දක් පමණ කලක් ආරණ්‍යකට සුදුසු ප්‍රතිරූපවන පෙදෙසක් සොයමින් රට පුරා සංචාරය කළේය. දෙනියාය, තිස්ස, රක්වාන, මොරවක, අකුරැස්ස, හොරණ, ගම්පහ, මිහින්තලය, අනුරාධපුරය හා කළුගල යන පළාත්වල පිහිටි වන සෙනසුන් හා වනාන්තර සිසාරා සතපුම් දහස් ගණනක් සැරිසැරිය. අවසානයේදී අගනුවරට සැතපුම් තිහක් පමණ දුරින් පිහිටි සියණෑ කෝරළයේ දොම්පේ පළාතේ මීතිරිගල මූකලාන නම්වූ රමණීය වන සොයා ගත හැකි විය. මීතිරිගල නිස්සරණ වනය නමින් ආරණ්‍යය ඉදිකර ඇත්තේ මීතිරිගල මහා මූකලාන මැද අක්කර 500 ක් පමණ භූමි භාගයකය. මෙහි මීතිරිගල යනු ගමේ නමයි. නිස්සරණ යන පාළි වචනයේ අර්ථය නිර්වාණය "නිවන" යනුයි. මේ නම යොදා ඇත්තේ ආරණ්‍යයේ පරමාර්ථයට අනුරූප වන අයුරුය. එනම් මේ ජීවිතයේ දීම නිවන් අවබෝධ කිරීමට පිහිට වන තැලැව යන අර්ථයෙනි.

එදා ජර්මනියේ දී ඇති කරගත් තීරණය එලෙසම ක්‍රියාත්මක කළ අසෝක වීරරත්න මහතා ලක්ෂ ගණන් වටිනා වෙළඳ ව්‍යාපාරය හැර දමා ලංකාව පුරා ගොස් සුදුසු ආරණ්‍යයක් හා සුදුසු කම්මට්ඨානාචාර්යයන් වහන්සේ නමක් හා සුදුසු භාවනායෝගි පිරිසක් අසීරුවෙන් සොයා ගෙන ආරණ්‍යයෙහි කුටි ආදිය තනා දන් එහි වැඩ අවසන් කර තමන් සතු කොළඹ පිහිටි මසකට දහස් ගණනක් ආදායම එන තවත් ලක්ෂ ගණන් වටිනා දෙමහල් ප්‍රාසාද ද හැර දමා ළඟදීම මීතිරිගල නිස්සරණ වනය විවෘත කරන දිනයේ දීම පැවිදිව වනවදී.



1957 මැයි මස 12 වෙනිදා "ඉරිදා ලංකාදීප" පුවත්පතේ පළ වූ ලිපිය (මුල් පිටුවේ) මෙහි දක්වේ.

# බටහිරට බෞද්ධ ලොකය

ලංකාවේ බෞද්ධ ධර්මය පිහිටෙව් මිහිඳු මහ රහතන් වහන්සේගේ පාද ස්පර්ශවූ මිහින්තලා පර්වත මුදුනෙන් ජර්මනියේ බෞද්ධ ධර්මය පැතිර වීමේ ඓතිහාසික ධර්ම දූත ගමන ආරම්භ වන්නේය.

මේ ධර්මදූත පිරිස ජර්මනිය බලා පිටත් වන්නේ ලබන මස 16 වෙනිදාය. පොසොන් පුර පසළොස්වකදා මිහින්තලාවෙන් ගමන ආරම්භ වෙයි.


ගරු සෝම හිමියන්ගේ ප්‍රධානත්වයෙන් ජර්මනියට යන මේ ධර්මදූත පිරිසට වජිරාරාමයේ ගරු කෙමින්ද, ගරු වින්ත යන හිමිවරු ද, ජර්මන් ධර්මදූත සංගමයේ ලේකම් අසෝක වීරරත්න, ඩබ්ලිව්. ජේ. සොයිසා යන මහත්වරු අයත් වෙති. සංගමයේ උප සභාපති ධර්ම ප්‍රිය මහින්ද මහතා මීට පෙර ජර්මනිය බලා පිටත් විය.

මේ අරමුදල පාලනය වන්නේ ඩබ්ලිව් සේනානායක, එච්. ඩබ්ලිව්. අමරසූරිය, ඩොක්ටර් පී. බී. ප්‍රනාන්දු යන මහතුන් ගෙන් යුත් මණ්ඩලයක් මගිනි.

ජර්මනියේ බෞද්ධ ධර්මය පැතිරවීම කටයුතු සංවිධානය කර තිබෙනුයේ එරටේ බෞද්ධයින් විශාල ගණනකගේ ඉල්ලීම් පරිදිය.

## ව්‍යාපාරයේ ඉතිහාසය

1952 දෙසැම්බර් මාසයේදී අසෝක වීරරත්න මහතාගේ පුරෝගාමීත්වයෙන් ආරම්භ කරන ලද මේ ජර්මන් ධර්මදූත සංගමයේ වැදගත් පරමාර්ථ සාර්ථක කර ගැනීම සඳහා 1954 දී සිටපු අගමැති ඩඩ්ලි සේනානායක මහතාගේ මූලිකත්වයෙන් රුපියල් දශ ලක්ෂයක අරමුදලක් ද ආරම්භ කරන ලදී.


ජර්මනියේ ධර්මය දූත ගමනට පෙරදින පිරිස

## මහ මළුවේ මහ මුළුවක්

බුද්ධ ජයන්තිය නිමිත්තෙන් ලබන 18 වෙනි සෙනසුරාදා අනුරාධපුර මහ මළුවේදී ශිෂ්‍ය භික්ෂු සංස්කෘතික මහා සම්මේලනයක් එක්සත් භික්ෂු පෙරමුණෙ මෙහෙයීමෙන් පැවැත්වීමට විධි විධාන යොදා තිබේ.

මෙම මහා සම්මේලනයට ඉන්දියාවේ අගමැති ශ්‍රී ජවහර්ලාල් නේරු තුමා හා අගමැති බණ්ඩාරනායක මහතාද සහභාගි වෙති.

**මීතිරිගල නිස්සරණ වනය**

**(1968 සැප්තැම්බර් මස 06 වෙනි සිකුරාදා රිවිරැස පුවත්පතෙහි පළ වූ ලිපිය)**

ගගාරින් ගුවනේ කරනම් ගැසුදා පහළවූන අරමුණක් අනුව බිහිවෙන මීතිරිගල නිස්සරණ වනය මෙරට බෞද්ධ ඉතිහාසයේ නව යුගයක් උදාකරනු නිසැකය.

මේ ආත්ම භාවයේදීම ධ්‍යාන මාර්ගඵල ලැබීම පරමාර්ථ කොටගත් ආරාණ්‍ය සේනාසනයක් මීතිරිගල නිස්සරණ වනය නමින් ළඟදීම ඇරඹේ. මේ ආරණ්‍යය නිසා බෞද්ධ ශාසන ඉතිහාසයේ නව යුගයක ආරම්භයත් - රන් අකුරෙන් ලියැවෙන කාල පරිච්ඡේදයත් - උදාවීම නියතය. ශාසනික චිරස්ථිතියටත්, ශාසනික ප්‍රතිසංස්කරණයටත්, ශාසනික නවෝදයක ටත් මේ මීතිරිගල නිස්සරණ වනය නිසැක වශයෙන්ම මග පාදන බව මෙහි ක්‍රියාත්මක කරන ප්‍රතිපත්ති මාලාව අනුව සක්සුදක් සේ පැහැදිළිය. නිස්සරණ වනයට පිවිසෙන තැන පිහිටි, විශ්‍රාම ශාලාවේ ඉදිරි බිත්තියේ සටහන් කොට ඇති පරිදි ඒ උදාර උත්කෘෂ්ඨ අති විශිෂ්ඨ පංක්ව ප්‍රතිපත්තීන් මේසේය.

"1. මෙහි ඇතුළත් වූ යෝගීන් වහන්සේලා මාර්ග ඵලයක් ලැබෙන තුරු ආරණ්‍ය භූමියෙන් පිට නොවෙත්.
2. කිසිම ගිහියෙක් සමග වත්, පිට කිසිම භික්ෂුවක් සමගවත් කථා නොකරත්.
3. මොනම කරුණක් නිසාවත් ධර්මය ගැනවත් ලිපි නොලියත්.
4. මාර්ග ඵලයක් නොලැබුණේ නම් පටන් ගත් වීර්යයෙන් යුතුව ජීවිතාන්තය දක්වාම විදර්ශනා භාවනා වඩත්.
5. මාර්ගඵල ලැබුණාට පසු උන්වහන්සේලා අනුකම්පාවෙන් බොහෝ දෙනා ගේ හිත සුව පිණිස අවබෝධාඥාණයෙන් ධර්මය දේශනා කිරීමට මහජනයා මැදට වඩිනවා ඇත."


මේ ප්‍රතිපත්ති අනුව නවක ප්‍රවේශකයින් එනම් අලුතෙන් පැවිදිවන අය සඳහා මාස හයක පමණ කාලයක් තුළ, පැවිදි ජීවිතයට අවශ්‍යයෙන්ම දැනගත යුතු ධර්ම පිළිබඳව දැනීමක් ත්‍රිපිටක පොත්පත් හා අවවාද අනුශාසනා මගින් ලබාදෙනු ලැබේ. ඒ කාල සීමාවෙන් පසු, ත්‍රිපිටක පොත් පත් කියවීම, පාඩම් කිරීම. ඒවා අලලා කෙරෙන සාකච්ඡා සම්පූර්ණයෙන්ම නතර කරනු ලැබේ. මේ පොතපත ඉගෙනුම නතර කරනු ලබන්නේ භාවනා කර්මස්ථානයන්ට එය බාධාවන හෙයිනුත්, මාර්ගඵල ලැබීමට දරන යෝධ ප්‍රයත්නය අඩපණ වී, ප්‍රමාදයට වැටෙන නිසාත්ය. මෙහි ඉහත සඳහන් ප්‍රථම ප්‍රතිපදා 3 යොදා ඇත්තේ භාවනාවෙහි යෙදෙන යෝගීන් වහන්සේට පරම විවේකය ලැබීමට අනුබල සඳහාය. නිවන් දැකීම සඳහා මේ විවේකය නැතුවම බැරිය. එමෙන්ම බාහිර ක්ලේශෝපාද්‍රවයන් ගෙන් හා අතුරු ආන්තරාවන් වලක්වනු සඳහාත්ය. බුදුරජාණන් වහන්සේ වදාළ පරිදි "රුක්ඛමූල ගතොවා, සුඤ්ඤාගාර ගතොවා, අරඤ්ඤගතොවා" රුක්ඛමූලගත නොව, සුඤ්ඤාගාරගත නොවී, ආරඤ්ඤගත නොවී, ධ්‍යාන මාර්ගඵල ලැබීම අති දුෂ්කරය. අති දුර්ලභය.



<u>Buddhist Mission to Germany in 1962</u>


**Three Buddhist Monks sponsored by the German Dharmaduta Society left for Germany in July 1962. Prior to their departure the monks met the then Prime Minister of Sri Lanka Mrs. Sirima Bandaranaike at Temple Trees.**

**Photo:**
**Left to Right:**
**Hon. C.P. de Silva, Minister of Lands and Land Development, Mr. Asoka Weeraratna (Hony. Secretary, German Dharmaduta Society, Mr. Lionel Fernando, Director of Information, Mrs. Sirima Bandaranaike, Prime Minister, Ven. Heenatiyana Dhammaloka Maha Thera, Ven. Urapola Hemaloka Thera and Ven. Wellampitiye Mettananda Thera.**



# Buddhist Shrine in Germany

The Observer 12 July 1958



BUDDHISTS of Ceylon have taken a giant stride forward in establishing Buddha Sasana in Germany and other countries of the West. They have acquired the famous Frohnau House in West Berlin which will now become the first Vihara and permanent Buddhist settlement in Europe. The German Dharmaduta Society of Ceylon purchased these premises from the heirs of the late Dr. Paul Dahlke, pioneer of Buddhist work in Germany, last month. Frohnau House is a three storied building with beautifully terraced grounds in extent about four acres.

A 'Sandakadapahana' or Moonstone and an imposing doorway out of rock with carvings of Bo-leaf motifs adorn the main entrance to the building. Even the iron grills of the windows are made out in the design of a Bo-leaf. The interior decorations include paintings and images of the Buddha and objects of religious interest.

Dr. Paul Dahlke was a physician by profession. He came to Ceylon with the object of joining the Holy Order of the Sangha but his health did not permit him to do so. He studied Pali and Buddhism at Paramadharma Chetiya Pirivena, Ratmalana and after he returned to Germany he led the exemplary life of an Upasaka and devoted his time to the dissemination of the Dhamma among the German people. He is the author of several scholarly works on Buddhism.


In order to help his friends and associates to lead the Buddhist way of life Dr. Dahlke built Frohnau House. It was his intention to dedicate these premises entirely for Buddhist religious work but unfortunately Dr. Dahlke died before he could carry out his intention. The three Dharmaduta Monks, Ven Kheminda Thera and Ven. Bhikkhu Vinitha led by the Ven. Soma Thera, all of Vajirarama, Bambalapitiya, who left Ceylon 6 months ago on their noble Mission to found Buddha Sasana in Germany are now in residence at Frohnau House.



1968 සැප්තැම්බර් මස 06 වෙනිදා "රිවිරැස" පුවත්පතේ පළ වූ ලිපිය මෙහි දක්වේ. කතෘ බන්දුල ශ්‍රී ගුණවර්ධන මහතා

# මිතිරිගල නිස්සරණ වනය

ගගාරින් ගුවනේ කරනම
පැසුද පහලවුන අරමුණක්
අනුව බිහිවෙන
මිතිරිගල නිස්සරණ
වනය මෙරට බොදු
ඉතිහාසයේ නව යුගයක්
උදකරනු නියැයය.






ආරම්භය

බන්දුල ශ්‍රී ගුණවර්ධන


පිළිවෙත්

## ජය මංගලම්












දහසක් කරදර මැද වීරරත්න මහතා මෙම මහා ආරණ්‍ය ආරම්භ කිරීමේ මහා කාර්ය භාරය එකලාවම කළේ හුදෙක් ලෞකික හැඟීම් වලට බර නොවී ලෝකෝත්තර අදහස් වලට නැඹුරුව ක්‍රියා කරන අය සොයා ගැනීමට තිබුණු අමාරුව නිසයි. ඒ නිසා මේ කටයුත්ත සඳහා වීරරත්න මහතා සමිතියක් පිහිටු වීමට අදහස් නොකළේය. එහෙම වුනත් පහත දක්වෙන කොන්දේසි 3 යටතේ බෞද්ධයිනට මේ පිංකමට සහභාගී වීමට අවස්ථාව සලසා දී ඇත. එනම් 1 මෙහි කිසිම සම්මාදම් ඉල්ලීමක් නැත. 2. සිය කැමැත්තෙන් දෙන මුදල් ද භාරගනු නොලැබේ. 3. කාර්යාලයෙන් විමසා වැඩක් ඇතොත් කරවාදීම කළ හැකිය.

ළඟදීම විවෘත වන මේ මීතිරිගල නිස්සරණ වනය සැදැහැවත් බෞද්ධ ජනතාවට නෙත් පුරා සිත් පුරා බලාගත හැකියි. විවෘත කළායින් පසුව යෝගීන් වහන්සේලාගේ විවේකී භාවනාවට බාධා වන නිසා අකමැත්තෙන් වුවත් මහජනයාට කුටි බැලීමට ඉඩදෙනු නොලැබේ. එහෙත් මාසයකට වරක් පසළොස්වක පෝදා ට දවල් 12 න් පසු පැය කිහිපයක් කුටි දක බලා ගැනීමට අවස්ථාව සැලැසීමට අදහස් කර ඇත.

මීතිරිගල නිස්සරණ වනය බලා ගැනීම සඳහා සංවිධානාත්මක බස් සේවයක් කොළඹ 7, බෞද්ධාලෝක මාවතේ/ කලින් බුලර්ස් පාරේ / අංක 417 දරන ස්ථානයේ ජර්මන් ධර්මදූත මධ්‍යස්ථානයෙන් සතියකට වරක් පෝදා පිටත් වේ.

කොළඹ පිටකොටුවේ මධ්‍ය බස් නැවතුම් පොළින් පිටත් වන කිරිඳිවැල බස් රථයෙන් කිරිඳිවැලට පැමිණ, එතැනින් රන්වල බස් රථයේ නැගී මීතිරිගල හන්දියෙන් බැස, මීතිරිගල නිස්සරණ වනය කරා පැමිණිය හැක.

ශ්‍රී ලංකාදීප පුවත්පතේ කතෘ මහනාම දිසානායක විසිනි.





1968 අගෝස්තු මස 22 වෙනිදා "ශ්‍රී ලංකාදීප" පුවත්පතේ පළ වූ ලිපිය මෙහි දක්වේ. කතෘ මහනාම දිසානායක මහතා විසිනි



# අසිරිමත් තපෝවනයක් මීතිරිගල බිහිවේ

## මේ අත්බැව්හි මග පල: බුදුසසුනේ නව යුගයක්

අවුරුදු 2512 ක් පමණ වන බෞද්ධ ශාසන ඉතිහාසයේ ප්‍රථම වරට මෙතෙක් නොදැනුවිරූ, මෙතෙක් නොදුටුවිරූ, මෙතෙක් නොඇසුවිරූ අන්දමේ ආරණ්‍ය සේනාසනයක් ළඟදීම විවෘත කෙරෙයි. මේ ආත්ම භාවයේදීම මාර්ගඵල ලැබීමේ පරම උත්සාහය වෙනුවෙන්ම ආරම්භ කරන ලද මේ ආරණ්‍යය මීතිරිගල නිස්සරණ වනයයි.

## අසිරිමත් තපෝවනයක් මීතිරිගල බිහිවේ.!

## මේ අත්බැව්හි මඟ පල : බුදු සසුනේ නව යුගයක්

**(1968 අගෝස්තු මස 22 වනදා "ශ්‍රී ලංකාදීප" පුවත්පතේ පළ වූ ලිපිය)**

අවුරුදු 2512 ක් පමණ වන බෞද්ධ ශාසන ඉතිහාසයේ ප්‍රථම වරට මෙතෙක් නොඇසූවිරූ, මෙතෙක් නොදුටුවිරූ, මෙතෙක් නොවූවිරූ අන්දමේ ආරණ්‍ය සේනාසනයක් ළඟදීම විවෘත කෙරෙයි. මේ ආත්ම භාවයේදීම මාර්ගඵල ලැබීමේ පරම උත්කෘෂ්ඨ චේතනාවෙන්ම ආරම්භ කරන ලද මේ ආරණ්‍යය මීතිරිගල නිස්සරණ වනයයි.

මේ සෙනසුන ආරම්භ කිරීමේ එකම අරමුණ මේ ජීවිත කාලය තුළදීම ධ්‍යාන මාර්ගඵල ලැබීමයි. මෙම ආරණ්‍යය අන්කිසිවකට නොදෙවෙනි අද්විතීය ශ්‍රේෂ්ඨතම එකක් වන්නේ, මෙහි උත්කෘෂ්ඨ පරමාර්ථය හා විශිෂ්ඨ ක්‍රියා මාර්ගය, මෙහි පිවිසෙන සියළුම යෝගීන් වහන්සේලා විසින් නොපිරිහෙලා එකාකාරවම අත්නොහැරම සිය කැමැත්තෙන්ම පිළිපදිනා බැවිනි.

තැනින් තැන නොයෙක් ආරණ්‍යවල දෙතුන් දෙනා බැගින් නොයෙකුත් අපහසු මැද නිවන් උදෙසාම භාවනා කරතත්, ආයතනයක් වශයෙන් ඇතුළුවන සියලුම යෝගීන් වහන්සේලා මේ අත්බැව්හීම නිවන් දැකීමේ පරම චේතනාවෙන් ජීවිත ආශාව අත්හැර, මහා යෝධ ප්‍රයත්නයක යෙදෙන ප්‍රථම අවස්ථාවයි මේ. මෙම උදාර අධ්‍යාශය සාක්ෂාත් කර ගැනීම සඳහා සකස් කර ඇති ප්‍රතිපත්ති මාලාව හා ක්‍රියා පිළිවෙල ආරණ්‍යයේ විශ්‍රාම ශාලා වට ඇතුළුවන තැන බිත්තියේ ලියා ඇති පරිදි මෙසේය :-

**"මෙහි ඇතුළත් වූ යෝගීන් වහන්සේලා මාර්ග ඵලයක් ලැබෙන තුරු ආරණ්‍ය භූමියෙන් පිට නොවෙත්, කිසිම ගිහියෙක් සමගවත්, පිට කිසිම භික්ෂුවක් සමග වත් කථා නොකරත්. මොනම කරුණක් නිසාවත් ධර්මය ගැනවත් ලිපි නොලියත්, මාර්ග ඵලයක් නොලැබුණේ නම් පටන් ගත් වීර්යයෙන් යුතුව ජීවිතාන්තය දක්වාම විදර්ශනා භාවනා වඩත්, මාර්ග ඵල ලැබුණාට පසු උන්වහන්සේලා අනුකම්පාවෙන් බොහෝ දෙනාගේ හිතසුව පිණිස අවබෝධඥානයෙන් ධර්මය දේශනා කිරීමට මහජනයා මැදට වඩිනවා ඇත."**

මේ ප්‍රතිපත්ති අනුව අලුතෙන් පැවිදිවන අය සඳහා මාස හයක පමණ කාලයක් තුළ, පැවිදි ජීවිතයට අවශ්‍යයෙන්ම දැනගත යුතු ධර්ම පිළිබඳව දැනීමක් ත්‍රිපිටක පොත්පත් හා අවවාද අනුශාසනා මගින් ලබාදෙයි. ඒ කාල සීමාවෙන් පසු ත්‍රිපිටක පොත් පත් කියවීම, පාඩම් කිරීම, ඒවා අලලා කෙරෙන සාකච්චා සම්පූර්ණයෙන්ම නතර කරයි. භාවනා කර්මස්ථානයන් ට එය බාධාවන හෙයිනුත්, මාර්ග ඵල ලැබීමට දරණ බලවත් උත්සාහය අඩපණවී, ප්‍රමාදයට වැටෙන බැවිනි.

**ප්‍රතිපත්ති**

මේ ප්‍රතිපත්ති මාලාව සකස් කර ගැනීමට ආදර්ශය ලැබුණේ මීට පෙර කාශ්‍යප බුදුන් කල සිදුවූ කථා පුවතකි. එකල ඒ සසුන ද මේ සසුන මෙන් පිරිහී ගෙන යද්දී භික්ෂූන් වහන්සේලා 7 නමක් මහා උස පව්වකට නැගී ඒ අත්බැව්හිම නිවන්



දැති උපචාරයක පළල අඩියකි. සතුන්ගෙන් වන පලිබෝධ දුරු කිරීම සඳහා එක් එක් මළුව වටා යොදන ලද කුඩා දිය අගල බැගින් ඇත. මහ ඝන වනය මැද සුදෝ සුදු වැලි අතුරා සකස් කරන ලද ඍජුව පෙනෙන එළිමහන් සක්මන් මළුව බිහිසුණු සසර කතරින් එතර වීමට ඉදි කරන ලද මහා මාවතක් සේ මැත සිට බලන කෙනකුට පෙනී යයි.

**බුදු මැඳුර**

ගස් කොලන් වලින් තොර වු විවෘත උස් සමබිමක් මත සුදෝ සුදුවන් බුදු මැඳුර ගොඩ නගා ඇත්තේ නො ඇලි නො ගැටී චිත්ත සමාධිය වැඩෙන ආකාරයටත් ශීලාදී සප්ත විසුද්ධීන්ගෙන් පරම ශාන්ත නිර්වාණ ධර්මය අවබෝධ කර ගන්නා විලාසයත් පිළිබිඹු වී පෙනෙන අයුරින් ය. බුදු මැඳුර බැලූ බැලූ හැම තැන සුදුය. පැතිත් සුදුය. වටේත් සුදුය. සුදෝ සුදුය. සුපිරිසුදුය. සුදෝ සුදුවන් මේ බුදු මැඳුරට පිවිසි කෙනෙහිම, සිත් සතන් තුළ වූ සකළ කෙලෙස් මල සිඳී බිඳී නිවී සැනහී සංහිඳී නිවන් ගියා වැන්න. සුදු බුදු මැඳුර මැද වැඩ සිටිනා සමාධි පිළිම වහන්සේ විදර්ශනා භාවනාවේ අග්‍රඵලය විදහා පායි. එය කෙතරම් ශාන්ත ද ප්‍රණීත ද යත් දකින දකින අය සතර මග සතර පල හා නිවන් යන නව ලොව්තුරා දහම් ලබනු සඳහා විදර්ශනා මාර්ගයෙහි ඉදිරියට මෙහෙයවන සුලුය.

විහාරයට පසුබිමින් පෙනෙන මහා කළුගල් පව්ව ඇසුරෙන් සකසා ඇති බෝමළුව ළකන්නා සුළුය. තිබඳ හමා යන මඳ නලින් නලියන බෝ පත් ඇති බෝරුක දඹදිව ආනන්ද බෝධියෙන් ලැබගත් බීජාංකුරයකි.

40 නමක් යෝගීන් වහන්සේලාට එකවර රැස්ව භාවනා කිරීමට පහසුකම් සහිතව තැනුණු සමූහ භාවනා ශාලාව භාවනාභිලාභීන් ගේ සිත් සතන් ප්‍රබෝධවත් කරන අයුරෙන් නිම කොට ඇති මෙය සීමා මාලකය වශයෙන් ද භාවිතා කෙරේ.

බටහිර හා ස්වදේශීය බෙහෙත් වර්ග හා වෛද්‍ය පහසුකම් වලින් සමන්විත ගිලන් හලේ රෝගී යෝගීන් සිව් දෙනෙකුට නේවාසික පහසුකම් සලසා ඇත.

**උඩ කුටිය**

බෝ මළුව ඉදිරියෙන් පෙනෙන මහා කළුගල් පර්වතය මුදුනට නැගීමට සෑදූ පඩි පෙළකි. ඒ පිය ගැට පෙළ නගින විට ඇති වන්නේ මිහින්තලා ගල හෝ ශ්‍රී පාදය නඟින විට ඇතිවන විදියේ ලොව්තුරා මිහිරියාවක් දන වන පහන් සංවේගය ඇති කර වන කරුණාපූර්වක සන්සුන් සංකල්පනාය.

මීට වර්ෂ කීපයකට ඉහත දී තමන් සතුව තිබූ ලක්ෂ ගණනක් අගනා රන් අබරණ හා ඔර්ලෝසු ව්‍යාපාරය අලුයම ලූ කෙළපිඩක් මෙන් හැරලූ වීරරත්න මහතා ළඟදීම තමන් සතුව කොළඹ ඇති, මසකට රුපියල් දහස් ගණනක ආදායමක් ලැබෙන තවත් ලක්ෂ ගණනක් වටිනා දෙමහල් මහා ප්‍රාසාද ද අත්හැර, සියලු ලෞකික සැප සම්පත් හා සුඛ විහරණ පා දූවිල්ලක් තරම් නොතකා ඒ හැම හැරපියා, පැවිදිව වන වදින්නේය.

**පහසුකම්**

සාරුප්‍ය වන පෙදෙසක් සෙවුම මෙන්ම අති අසීරු කරුණක් වූයේ පොත පතෙහි දැනුමට පමණක් සීමා නොවූ ප්‍රායෝගික වශයෙන් භාවිතාමය ප්‍රවීණත්වයක් ලැබූ තපෝවෘධ, ශීලවෘධ, ගුණවෘධ, කර්මස්ථානාචාර්ය පාදයාණන් වහන්සේ නමක් සොයා ගැනීමයි. මාතර පණ්ඩිත ශ්‍රී ඥාණ ාරාම මහා ස්ථවිර පාදයාණන් වහන්සේ හමුවීමෙන් එම අති දුර්ලභ කාර්යය සිතැඟි පරිදි සමෘද්ධ විය.

කොළඹ නුවර පාරේ 16 වැනි සැතැපුම් කණුවට මඳක් එහායින් පිහිටි බැලුම්මහර හන්දියෙන් දකුණට හැරී සැතැපුම් 3 ක් ගොස් වැලිවේරිය කඩ පොළට ළඟා වේ. එම කඩපල පසුකළ වහාම වමට හැරී කිරිඳිවැලට සැතැපුම් 8 ක් ගොස්, එතැනින් දකුණට හැරී සැතැපුම් 2 ක් ගියවිට හමුවන්නේ පල්ලේගම හන්දියයි. එම හන්දියෙන් වමට හැරී සැතැපුම් 3 ක් ගියවිට මීතිරිගල ට ළඟාවේ. මීතිරිගල ගම මැදින් වැටුනු ගුරු පාර දිගේ සැතැපුම් ¾ ක් ගිය කළ ලී පාලමක් දමා ඇති කුඩා ඔයක් හමුවේ. මේ ඔය දක්වා බසයෙන් හෝ රථයෙන් පැමිණිය හැක. ඔයෙන් එතෙරවූ තැන ගත සිත පිනා යන මද නල හමා යන දර්ශනීය වෙල්යායකි. වෙල්යායේ සිට බලත්, ඉදිරිපසින් පෙනී යනුයේ රමණීය මීතිරිගල නිස්සරණ වනයයි. හාත්පස පෙනෙන තෙක් මානේ ගෙයක් දොරක් නැත. වනයට පිවිස හැටියේම හමුවන්නේ ආරණ්‍ය බැලීමට හා දන් පිළිගැන්වීමට දිවයිනේ නොයෙකුත් පළාත්වලින් පැමිණෙන බෞද්ධ මහජනතාවගේ සුව පහසුව සඳහා පිළියෙල කොට ඇති විශ්‍රාම ශාලාවය. විශ්‍රාම ශාලාව කාමර 5 කින් හා සාලාවකින් සමන්විතය. ඊට මඳක් ඉහළින් 150 පමණ ජනකායට පහසුවෙන් ආහාර ගතහැකි පරිදි විශාල භෝජන ශාලාවක් ද ඉදිකර ඇත. මහජන පහසුව උදෙසා ජලනල පහසුකම් සහිත වැසිකිළි පේළියක්ද තනා ඇත. වානසාවකට මෙන් පැමිණෙන මහජනාව ගේ ගමන් විඩාව සන්සිඳුවා ගැනීම පිණිස, නෑම සඳහා නිබඳ ගලා බස්නා සිසිල් දිය දහරා ඇති කුඩා දිය ඇල්ලක් ඇත. ස්වාභාවික පොකුණක් සහ කෘතිම තඩාගයක් ද ඇත.

විශ්‍රාම ශාලාව පසුකොට මඳ දුරක් යන විට යෝගීන් වහන්සේලා සඳහා තැනුණු කුටි දක්ක හැකිය. එකිනෙකට නොපෙනෙන අයුරෙන් දුනටම තැනින් තැන තනා නිම කොට ඇති කුටි ගණන 15 කි. එක් එක් කුටියක අඩි 10 ක් දිග අඩි 7 ක් පළල වූ කාමරයක් බැගින් ඇත. අඩි 4 ක් පළල අඩි 45 ක් දිග ආවරණය කරන ලද සක්මන් මළුවකින් ද ඊටම යාබදව තැනුණු විසිකිළියකින් ද, ජලනල ඇති වතුර ටැංකියකින් ද යනාදී සියලු පහසුකම් වලින්ද සමන්විත මෙම කුටි ඉදිකර ඇත්තේ කළු ගලිනි. සැතැපීම සඳහා සැකැසුණු ලෑලි ඇඳක් බැගින් එක් එක් කුටියකටම යහපත් වාතාශ්‍රය ලැබෙන අයුරු ජනෙල් හා සුළං කවුලු යොදා ඇත. කුටි මිදුල චිත්ත ප්‍රබෝධය ඇති වන අයුරින් ශෝභන ලෙස පිළියෙල වූයේය. මිදුල පුරා වැලි අතුරා ඇත. දිගින් අඩි 90,60 සහ 45 බැගින් වන පරිදි තුන් ප්‍රමාණයකට පිට සක්මන් මළු ඒ ඒ කුටිය තනා ඇති තැනට ගැලපෙන අයුරින් ඉදිකර තිබේ. එක් සක්මනක මැද මළුවක පළල අඩි 4 ක් වන අතර, මළුවක පළල අඩි 4 ක් වන අතර, මළුවක් වටේ



දැකීමට එබඳු ප්‍රතිපත්ති මාලාවක් යටතේ මහා ප්‍රයත්නයක යෙදුණාහ. ඉහත කී ප්‍රතිපත්ති අනුරූපව ප්‍රදන් වීර්යයෙහි යෙදුණු උන්වහන්සේලා අතරින් දෙනමක් සතියක් තුළදී අභිඥා සහිත රහත් හා අනාගාමී ඵලවලට පත්වූහ.

මෙබඳු දුෂ්කර ප්‍රතිපත්ති යටතේ භාවනා යෝගීව පිළිවෙත් පිරීම සඳහා, තම තමන් යෙදී සිටි වැදගත් රැකිරක්ෂා නිලතල, තමන්සතු ඉඩකඩම් ගේ දොර, වතුපිටි නෑදෑ හිතවතුන් ආදී සියලු උපභෝග, පරිභෝග කාමවස්තූන් හැර පියා නියම අභිනිෂ්ක්‍රමණයක යෙදී සේනාසනය විවෘත කරන දිනය වන තෙක් සැදී පැහැදී පේවී පුලපුලා බලා සිටින උද්‍යෝගිමත් සැදෑහැවත් පිරිස කෙනෙක් දෙන්නෙක් නොවෙති. පහළොස්ම දෙනෙකි. මේ පිරිස අතුරෙන් නිස්සරණ හැඟීම් ඇති ගිහි පින්වතුන් සත් දෙනෙක් මීතිරිගල නිස්සරණ වනය විවෘත කරන දිනයේදී පැවිදි වන්නාහ.

මීතිරිගල නිස්සරණ වනය ඇරඹීමට තුඩුදුන් පුවත නව කතාවක් මෙන් රසවත් ය. මනුෂ්‍ය ඉතිහාසයේ ශ්‍රේෂ්ඨ තම සිද්ධියක් වූ දිනයකි. එනම් ප්‍රථම වරට රුසියන් ගගාරින් අභ්‍යාවකාශය තරණය කළ දිනය. ලංකාවෙන් පළමු වරට ජර්මනියට ස්ථිර ධර්මදූත සේවයක් මෙහෙය වූ ජර්මන් ධර්මදූත සංගමයේ ආරම්භක අසෝක වීරරත්න මහතා එදින සිටියේ ජර්මනියේ බර්ලින් නුවරයි. අභ්‍යාවකාශයේ මිනිසෙක් සැරිසරන බව ඇසූ කෙනෙහිම ඒ මහතා තුළ අතිශය ශ්‍රේෂ්ඨතම පරම දුර්ලභ ධර්මකාමී අදහසක් පහළ විය. ඒ අදහස නම්, "දැන් මේ විද්‍යාඥයන් අභ්‍යාවකාශයෙහි සැරි සරන්නේ, දීර්ඝ කාලාන්තරයක් මුළුල්ලේ නොකඩවා දියුණු කරන ලද ද්‍රව්‍යාත්මක ලෞකික විද්‍යා ශාස්ත්‍රයන් ගේ ප්‍රතිඵලයක් වශයෙනි. එසේම අපද සුපිරිසිදු ශීලයෙහි පිහිටා දිගුකලක් අත්නොහැරම, නිරන්තර කරන විදර්ශනා භාවනා අභ්‍යාසයෙහි යෙදුණහොත් ධ්‍යාන මාර්ගඵල ලැබීම නියත සිද්ධියෙකි. මෙකල මාර්ගඵල ලැබිය නොහැකිව පවත්නේ, මගපල ලැබීම සඳහාම දිවිකැප කොට භාවනා කරන අයගේ දුර්ලභත්වය නිසා මිස අන්කිසි කරුණක් නිසා නොවේමැයි. ශ්‍රාවකයෝ අප්‍රමාදීව භාවනා කරත්නම් ලෝකය රහතුන් ගෙන් හිස් නොවේයැයි මහා පරිනිර්වාණ සූත්‍රයෙහි ලා බුදුන් වහන්සේ දෙසා වදාරා ඇත.

වීරරත්න මහතා පෙරළා සිය රටට පැමිණි වහාම තම සොහොයුරු හමුව, මින්පසු මොනම ලෞකික වැඩක තමන් නොයෙදන බවත්, මුළු මහත් ජීවිත කාලයම මාර්ගඵල ඉපද වීම සඳහාම කටයුතු කරනු විනා අන්කිසිම වැඩක නොයෙදෙන බවත් තරයේ කියා සිටියේය. ඒ අචල දෘඩ අධිෂ්ඨානයෙහි ස්ථිරව පිහිටා සිටි වීරරත්න මහතා, කොළඹ මරදානේ තමන් සතුව තිබූ ලක්ෂ ගණන් වටිනා රන් අබරණ හා ඔර්ලෝසු වෙළඳ ව්‍යාපාරය අත්හළේය.

ඉක්බිතිව දිවා රෑ නොතකමින් සම්පූර්ණ කාලය යොදමින් හය මාසයක් පමණ කාලයක් සියලු සප්පායන් ගෙන් සමන්විත ආරණ්‍යයකට යෝග්‍ය වන පෙදෙසක් සොයමින්, තිස්ස, දෙනියාය, මොරවක, රක්වාන, හොරණ, අකුරැස්ස, ගම්පහ, අනුරාධපුරය, මිහින්තලය, කළුගල ආදී වන සෙනසුන් හා වනාන්තර පීරමින් දිවයින පුරා සැරිසැරිය. මෙම සංචාරයේ දී කොළඹට සැතැපුම් 30 ක් පමණ දුරින් පිහිටි, දොම්පේ ප්‍රදේශයේ මීතිරිගල මුකලාන නමැති රමණීය වනය හමු විය. මීතිරිගල නිස්සරණ වනය අරඹා ඇත්තේ අක්කර 500 ක භූමි භාගයකය.

